www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් බ්‍රසල්ස් නුවර දී : එක්සත් ජනපදය පැතිර යන මැද පෙරදිග යුද්ධයක තර්ජන ඉහල නංවයි

## Bush in Brussels: US steps up threats of wider Mideasts war

පැට්‍රික් මාටින් විසිනි
2005 පෙබරවාරි 24

ජෝර්ජ් බුෂ් සිය යුරෝපා සංචාරය බ්‍රසල්ස් නුවරින් ආරම්භ කලේ වර්තමාන ඉරාක යුද්ධය, මැද පෙරදිග බොහෝ ප්‍රදේශ අලලා ගත් පුලුල් යුද ගැටුමක් බවට පත් කල හැකි නව මිලිටරි තර්ජනයන් හා ප්‍රකෝපකරනයන් සමග එක්සත් ජනපදය ඉදිරියට ගමන් කරන බව තම සත්කාරකයන් වෙත දන්වා සිටින, යුදකාමී ප්‍රකාශනයන් මාලාවක් ද සමගින් ය.

ඉරානය බුෂ්ගේ තර්ජනවල ප්‍රධාන ඉලක්කය වූ අතර සිරියාව ද දැඩි අනතුරු හැඟවීමකට භාජන විය. න්‍යෂ්ටික අවි ගොඩනැංවීමේ සැලසුම් පිලිබඳව එල්ල කෙරෙන චෝදනා මත ටෙහෙරානය හෙලා දුටු එක්සත් ජනපද ජනාධිපති, බල ශක්ති නිෂ්පාදනය සඳහා න්‍යෂ්ටික බලය යොදා ගන්නා වැඩපිලිවෙල සීමා කිරීමේ පොරොන්දු මත ඉරානයට ආර්ථික සහන දීමේ බ්‍රිතාන්‍ය, ප්‍රන්ස හා ජර්මන් මූලෝපායට සිය විරුද්ධත්වය ද පල කලේ ය. ඉරානය ''ජාත්‍යන්තර ප්‍රජාව සමග වූ කොන්ත්‍රාත්තුවක් උල්ලංඝනය කොට ඇතැයි ද වග උත්තර කිව යුත්තේ එම පාර්ශ්වය මිස අප කවුරුවත් නො වේ.'' යයි ද බුෂ් කියා සිටියේ ය.

ඉරාකයට පහර දීමට පෙර එක්සත් ජාතීන්ගේ විවිධ එකඟතාවයන් උල්ලංඝනය කලේ යයි සදාම් හුසේන්ට චෝදනා කල ජෝර්ජ් බුෂ්ගේ මෑත දෙඩවීම්වලට මෙම භාෂාව සමාන විය. ඒ අතර එක්සත් ජනපදය ඉරානය සතුව ඇතැයි සැලකෙන න්‍යෂ්ටික අවි පර්යේෂනාගාර වෙත පහර එල්ල කරන බවට පලවූ මාධ්‍ය වාර්තා ප්‍රතික්ෂේප කිරීමට බුෂ් තම කතාවෙන් පිට පැන ගියේ ය.

ඉලක්ක තෝරා ගැනීමට විශේෂ හමුදා කන්ඩායම් ඉරානය තුලට යැවීම ද ඇතුලත් එවැනි ප්‍රහාර පිලිබඳ පෙන්ටගනයේ සැලසුම් නිව් යෝකර් පුවත්පත පසුගිය මාසයේ වාර්තා කලේ ය. ඉරානයේ බටහිර හා නැගෙනහිර දේශ සීමා බඳ ඉරාකයේ ද ඇෆ්ගනිස්තානයේ ද ඇමරිකානු භටයන් 160,000ක් රඳවා සිටීම සැලකිල්ලට ගනිමින් ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයන් සඳහා වූ දිගුකාලීන සැලසුම්, තමන් ක්‍රමානුකූලව සකසමින් සිටින බව පෙන්ටගනය සනාථ කර තිබේ.

පසුගිය සතියේ වොෂින්ටනයේ ඔලිම්පියා විද්‍යාල මන්ඩපයක දී කතා කල හිටපු එක්සත් ජනපද ප්‍රධාන අවි නිරීක්ෂක ස්කොට් රිටර්, ඉරානයේ තෝරා ගත් ඉලක්කවලට 2005 ජූනි මාසයේ දී ගුවන් ප්‍රහාර එල්ල කිරීමට බුෂ් දැනටමත් අනුමැතිය දී ඇතැයි ප්‍රකාශ කලේ ය. බැග්ඩෑඩයේ ඉරාන හිතවාදී පාලන තන්ත්‍රයක් ඉස්මතු වීම වැලැක්වීමේ අරමුනින් ජනවාරි 30 දා පැවති ඉරාක මැතිවරනයෙන් ජයගත් ෂියා කන්ඩායම්වල ඡන්ද ප්‍රමානය සියයට 56 සිට 48 දක්වා අඩු කිරීමට, බුෂ් පරිපාලනය, අතදමා ඇති බව ද රිටර් කියා සිටියේ ය. ඉරානයට එරෙහි යුද වැඩපිලිවෙල වාර්තාකල නිව් යෝකර් පුවත්පතේ මාධ්‍යවේදී සෙයිමර් හර්ෂ්, ඉරාක මැතිවරන වංචාව පිලිබඳව කරුනු හෙලිදරව් කිරීමට නියමිතව සිටි බවද ඔහු ඉගි කලේ ය.

අඟහරුවාදා පැවති මාධ්‍ය හමුවක දී ''එක්සත් ජනපදය ඉරානයට පහර දීම සඳහා සූදානම් වෙමින් සිටින්නේ ය යන මතය අභූතයක් '' බව බුෂ් ප්‍රකාශ කලේ ය. මාධ්‍යකරුවන් සිනහ ගන්වමින් ඔහු ඒ සමග ම මෙසේ ද ප්‍රකාශ කලේ ය. ''ඊට අමතරව සියලු ම විකල්පයන් විවෘතව තිබේ.''

''ලෙබනනය යටත් කර ගෙන සිටින ආක්‍රමනිකයෙක්'' ලෙස නම් කරමින් බුෂ්, සිරියාව ගැන කල විවේචනය ද ඒ හා සමානව ම ප්‍රකෝපකාරී ය. එක්සත් ජනපද මිලිටරියේ සේනාධිනායකයා ලෙස, සිරියාවට වඩා දස ගුනයකින් වැඩි හමුදාවක් ද ඇතිව ඉරාකය යටත් කර ගැනීමට බුෂ් නායකත්වය දෙන්නේ වඩාත් ලේ පිපාසිත හා සාහසික ආකාරයකට ය. තවද ඔහු, ලෙබනනය තුල සිරියානු හමුදා රඳවා සිටින කාලයට වඩා වසර නවයකට වැඩි කාලයක් බටහිර ඉවුර හා ගාසා තීරය අල්ලා ගෙන සිටින ඊස්රායල ආන්ඩුවේ උද්යෝගීමත් ආධාරකරුවෙකි.

පීඩිත ෂියා මුස්ලිම්වරුන්ගේ ද, පලස්තීන

සරනාගතයන්ගේ ද, ඒකාබද්ධ තර්ජනයෙන් දක්ෂිනාංශික ක්‍රිස්තියානි ෆැලැන්ජිස්ට් පාලන තන්ත්‍රය මුදවා හැරීම සඳහා මුලදී එක්සත් ජනපදය හා ඊස්රායලය යන දෙරටෙහි ම නිහඬ අනුකූලතාවය ඇතිව සිරියාව, ලෙබනනයට මැදිහත් වූ බව ඓතිහාසික කාරනයකි. එහි දී ටෙල් අල්-සාටර් සරනාගත කඳවුරෙහි සිරියානු හිතවාදී ෆැලැන්ජිස්ට්වරුන් විසින් ගෙනගිය පලස්තීනු සංහාරය වැනි ම්ලේච්ඡ ක්‍රියාවන්ට සිරියාව මූලිකත්වය ගත්තේ ය.

ශත වර්ෂ කාලකට පසු ලෙබනනය තුල සිරියානු ආධිපත්‍යය නො ඉවසිය හැකි බව එක්සත් ජනපදයට එක්වර ම වැටහී තිබේ. මෙය කිසි සේත් ම එක්සත් ජනපදය හා ඊස්රායලය යන දෙපාර්ශ්වයම, දිගු කලක් තිස්සේ නොසලකා හැර ඇති, ලෙබනන් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය හා ජාතික අයිතීන් පිලිබඳව හටගත් කනස්සල්ල නිසා ඇති වූවක් නොව, ඇමරිකානු අධිරාජ්‍යවාදයට ඉරාකයේ යටත්විජිත පාලකයා ලෙස අලුතින් හිමි වී ඇති වාසිදායක තැන, මැදපෙරදිග කලාපය පුරා ම සිය අනසක පැතිරවීමට යොදා ගැනීමේ දී, ඊලඟ බාධකය ලෙස සිරියාව දැක ගැනීම නිසා ඇති වූවකි.

මෙහි නොවරදින කාරනය වන්නේ න්‍යෂ්ටික අවි සතුව ඇති ප්‍රධාන රටවල් දෙකක් වන චීනය හා රුසියාවට තර්ජනාංගුලිය එසවීම යි. රට තුල ප්‍රජාතන්ත්‍රවාදය ද පිට රටට ආයුධ විකිනීම ද පිලිබඳ එක්සත් ජනපදයේ බලාපොරොත්තු, රුසියාව විසින් ඉටු කිරීමේ අවශ්‍යතාවය ව්ලැඩිමීර් පුටින් සමග පැවැත්වීමට නියමිත සමුලුවට පෙරහුරුවක් ලෙස කල දේශනයේ දී අවධාරනය කල බුෂ්, අති නවීන ආයුධ පද්ධතීන් බීජිනයට නො විකුනන ලෙස යුරෝපා සංගමය පෙලඹවී ය.

විශාලතම රුසියානු පුද්ගලික තෙල් සමාගම වන යුකෝස් රජයට පවරාගැනීම වැනි කටයුතු ද මෑතක දී පැවති යුක්රේන මැතිවරනයේ දී අගමැති ලෙස පත් වූ එක්සත් ජනපදයේ අනුග්‍රහය ලත් අපේක්ෂක වික්ටර් යුශ්චෙන්කෝට පුටින් දක්වන විරුද්ධත්වය ද නිසා ප්‍රධාන කාර්මික රටවල් අටේ සාමාජිකත්වයෙන් රුසියාව නෙරපන ලෙස ඉල්ලමින් එක්සත් ජනපදයේ ප්‍රමුඛ සෙනෙට් සභිකයන් දෙදෙනෙක් වනරිපබ්ලිකානු ජෝන් මැකේන් හා ඩිමොක්‍රැටික ජෝසෆ් ලිබර්මාන් පෙබරවාරි 18 යෝජනාවක් ගෙන ආහ.

''ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ පාලනය කෙරෙහි තම කැපවීම යලි පනගන්වන ලෙස''ට බලකරමින් සඳුදා රුසියාව පිලිබඳව කල බුෂ්ගේ ප්‍රකාශය, තමන් හඳුනාගත් අවශ්‍යතාවන් පරදුවට තැබෙන විටෙක කිසිදු නීතියකින් එක්සත් ජනපදය බැඳ තැබිය නොහැකි ය යන තර්කය මත පදනම් වූ විදේශ ප්‍රතිපත්තියක් සහිත පරිපාලනයකින් කරනු ලබන විට සංකේතාත්මකව ප්‍රෝඩාකාරී ය. තමන් කිසිවිටෙක ජාත්‍යන්තර නීතිය මගින් වැලැක්විය නොහැකි වන බව බුෂ් යලියලිත් ප්‍රකාශ කොට ඇති අතර එය එක්සත් ජාතීන්ගේ සංවිධානයට, ප්‍රන්සයට හෝ එවැනි වෙනත් රටකට එක්සත් ජනපදයේ මිලිටරි කටයුතුවලට එරෙහිව ''නිෂේධ බලය'' පැවරීමක් ලෙස ඔහු ජාත්‍යන්තර නීතිය හෙලා දකියි.

එක්සත් ජනපදය තුල ඇති ප්‍රවනතාවය වන්නේ, ඔහු ප්‍රකාශයට පත් කල පරිදි, ''එක්ස් ජනපදය පෙනී සිටින්නේ නිදහස් ජන මාධ්‍යයක්, සක්‍රිය විරුද්ධපාර්ශ්වයක් හා බලය බෙදා ගැනීමක් සඳහා'' නොව හරියටම එහි අනික් පැත්ත වන බියගුලු ජන මාධ්‍යයක්, සංකේතාත්මක විපාර්ශ්වයක් හා 2000 මැතිවරනය සොරකම් කල හා පසුගිය නොවැම්බර් මැතිවරනය යාන්තමින් දිනා ගත් හා එහි බලයට කිසිදු අභියෝගයක් නොමැත්තා වූ පරිපාලනයකි.

චීනය පිලිබඳව බුෂ් ප්‍රකාශ කලේ ආයුධ විකිනීම සම්බන්ධයෙන් 15 අවුරුදු තහනම ඉවත් කරන යුරෝපා සංගමයේ සැලැස්මක් ''චීනය හා තායිවානය අතර සම්බන්ධතාවයේ බල තුලනය වෙනස් කරනු'' ඇති බව යි. කෙසේ වෙතත් ඔහුගේ සැබෑ උත්සුකය පවතින්නේ චීනය හා තායිවානය අතර තුලනය පිලිබඳව නොව චීනය හා එක්සත් ජනපදය අතර තුලනය පිලිබඳවයි. පෙන්ටගනයේ නිලධාරින් ද එක්සත් ජනපදයේ දක්ෂිනාංශික මහ මොල කාරයන් ද යන දෙකොටස ම විශේෂයෙන් ම චීනය සතු ආර්ථික ශක්තිය හා දැවැන්ත ජන සංඛ්‍යාව, යුරෝපය විසින් සපයනු ලබන වැඩි දියුනු තාක්ෂනය සමග බද්ධ වී ගත හොත් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ වඩාත් බලගතු අනාගත ප්‍රතිමල්ලවයා ලෙස චීනය දැක ගනිති.

ඇවැක්ස් (ඒඩබ්ලිව්ඒසී එස්) නමින් හඳුන්වන ඇමරිකානු ගුවන් ගත පූර්ව අනතුරු ඇඟවීමේ හා පාලනය කිරීමේ පද්ධතීන් ද ''හුරු බුහුටි'' ආයුධ සමග සැසඳෙන්නා වූ අධිතාක්ෂනික මෙහෙයුම් හා පාලන පද්ධතීන් ඉලක්කය සොයා යෑමේ හැකියාවන් ද චීනයට අත් කර ගැනීමට හෝ වර්ධනය කර ගැනීමට හැකිවෙතැයි යන්න ගැන විශේෂිත කනස්සල්ලක් වොෂින්ටනයට ඇත. තායිවාන සමුද්‍ර සන්ධිය පාලනය කිරීම සඳහා ගුවන් හා නාවික බලය යොදාගැනීම මත පදනම්වූ වත්මන් ඇත පෙරදිග ඇමරිකානු යුද සැලැස්ම මෙමගින් යල් පිනූ එකක් බවට පත් කරනු ඇත.

බ්‍රසල්ස්හි දී බුෂ්ගේ චන්ඩිකම් සිත්ගන්නා ආක්‍රමනයක් ලෙස මවා පාමින් ඇමරිකානු ජන මාධ්‍ය ධවල මන්දිර දේශපාලන නිවේදකයන්ගේ මඟපෙන්වීමට කීකරු ලෙස අනුගතවූ අතර ඉරාකය ආක්‍රමනය හා එය යටත් කිරීමේ සිය තීරනය පිලිබඳව හටගත් තියුනු ගැටුම්වලින් පසුව යුරෝපීය නායකයන්

සමග වූ ආරෝව වලලා දැමීමට ඇමරිකානු ජනාධිපති ගත් උත්සාහය ''සිත් ගන්නා ආක්‍රමනය'' ලෙස සැලකේ. රාජ්‍ය තාන්ත්‍රික උපාමාරු මගින් ආවරනය කරනු ලැබුව ද සත්‍යය වන්නේ ප්‍රතිමල්ලව අධිරාජ්‍යවාදී බලවතුන් අතර ආතතීන් දැන් 2003 දී තිබුනාටත් වඩා වැඩි බවයි.

ඉරාක ආරක්ෂක හමුදා පුහුනු කිරීම සඳහා සහයෝගය දීමට අඟහරුවාදා පැවති නැටෝ සමුලුවේ සාකච්ඡාව තුලදී මෙම ගැටුම තියුනු ලෙස ඉස්මතු විය. රටින් පිට ඉරාක ජාතිකයන් පුහුනු කිරීමට අනුග්‍රහ දැක්වීමට පමනක් අනුමැතිය පල කරමින් රටවල් 6ක් ඉරාකයට හමුදා පුහුනුකරුවන් යැවීම ප්‍රතික්ෂේප කල ද, එක්සත් ජනපදය මෙහෙයවන සන්ධානයේ සාමාජික රටවල් 26 ම අවසානයේ දී සමුලුවට සහභාගිවීමට එකඟ වූහ. නැටෝ පුහුනු කටයුතු සම්බන්ධීකරනයට උදව් වීම සඳහා ජනාධිපති ජැක් චිරැක් අවසානයේ දී එක් ප්‍රන්ස නිලධාරියෙකු එවීමට එකඟ වූව ද ප්‍රන්සයේ අනුමැතිය විශේෂයෙන් ම නුරුස්නා සුලු එකක් විය.

ඉරාකය තුල එක්සත් ජනපද යටත්විජිත පාලන තන්ත්‍රයේ නීත්‍යානුකූලභාවය මූලධර්මයක් ලෙස මෙසේ පිලිගැනීම බුෂ් උනුසුම්ව භාරගත්තේ ය. ''එම මේසය වටා වාඩි වී සිටි ජාතීන් 26ක්, නැටෝව ඉරාකයේ කටයුතුවලට සම්බන්ධ වීම වැදගත් බව පැවසූහ'' යි ඔහු කීය. ''එය ශක්තිමත් ප්‍රකාශනයක්.'' එක් නිලධාරියකු ප්‍රන්ස ප්‍රතිපදානය පිලිබඳව විමසූ විට ඔහු පිලිතුරු දුන්නේ ''සෑම ප්‍රතිපදානයක් ම උපකාරී වේ'' යනුවෙනි.

ඉරාකයේ දී එක්සත් ජනපදයට ද්‍රව්‍යමය ආධාර සැපයීම සම්බන්ධයෙන් නැටෝ එකඟතාවෙන් සැලසුනේ සුලු පිටුබලයක් වුව ද මෙම යටත්වීමේ දේශපාලනික අර්ථභාරය නොතකා හැරිය නො හැක. එය හුදෙක් එක්සත් ජනපදයට ඇති බිය නිසා හෝ බුෂ් පරිපාලනය යලි තේරී පත්වීමේ යථාර්ථයට අනුගත වීම නිසා සිදුවූවක් නො වේ. වඩාත් මූලිකව තීරනාත්මක සම්පත් හා මූලෝපායික ස්ථානයන්හි පාලනය පිලිබඳව ප්‍රතිමල්ලව අධිරාජ්‍යවාදී බලවතුන් අතර වන ගැටුම උත්සන්න වන තතු තුල යුරෝපීය බලවතුන් තමන්ගේ ම ඉරාකයක් හා ඇෆ්ගනිස්තානයක් සඳහා සූදානම් වෙති.

ආන්ඩු 26න් එකක් වත් සත්‍යය යයි තමන් දන්නා දේ ප්‍රකාශ කිරීමට කරදර වූයේ නැතඃ ඉරාකයට එක්සත් ජනපදය කල මැදිහත් වීමේ නීති විරෝධී බව, එය ජාත්‍යන්තර නීතිය යටතේ යුද අපරාධයක් වන බව හා එම අභ්‍යාසයට සහභාගිවන සියලු ම දෙනා ජිනීවා සම්මුතීන් හා 1946 නියුරෙම්බර්ග්හි දී පැනවූ පූර්වාදර්ශයන් යටතේ යුද අපරාධකරුවන් වන බව තම ඇමරිකානු සගයන්ට මෙන් ම යුරෝපීය අධිරාජ්‍යවාදීන්ට ද එවැනි චෝදනා අදාල වන්නේ පරාජිත වූ හෝ දෙවන පෙල යුද අපරාධකරුවන් සඳහා පමනකි.

තවද ඉරානය, සිරියාව, චීනය හා රුසියාව යන රටවලට එරෙහිව බුෂ්ගේ බැනවැදීම් මධ්‍යයේ, මැදපෙරදිග කලාපය තුල ඇමරිකානු ආක්‍රමනකාරිත්වයේ ගාමක බලය, ඇමරිකානු ධනවාදයේ ශක්තිය නොව දුර්වලත්වය බවට තියුනු සිහි කැඳවීමක් පවතියි. යුරෝවට හා යෙන් මුදලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයේ තියුනු අවප්‍රමාන වීමක් නිසා දකුනු කොරියානු මධ්‍යම බැංකුව තම සංචිතවලින් බොහොමයක් ඩොලර්වලින් නොව වෙනත් මුදල්වලින් පවත්වාගෙන යාමට සැලසුම් කරමින් සිටින බවට වාර්තාවක් ලැබීමෙන් පසු එක්සත් ජනපද කොටස් වෙලඳපොල අඟහරුවාදා කඩා වැටුනි.

යුරෝව, යෙන් මුදල, බ්‍රිතාන්‍ය පවුම, කැනේඩියානු ඩොලරය හා ස්විස් ෆ්‍රෑන්ක් මුදලට සාපේක්ෂව ඩොලරය පහත වට්ටමින් මෙම වාර්තා මූල්‍ය වෙලඳපලවල් හරහා කම්පන තරංග මුදා හැරී ය. ඩොලර්වලින් ගනනය කරන ලද තෙල් මිල ද තියුනු ලෙස ඉහල නැගුනි. එක් වෙලඳ වාරයකදී පමනක් රත්රන් අවුන්සයක මිල ඩොලර් 7කින් ඉහල නැගුනි.

දකුනු කොරියාවේ හා ජපානයේ මහ බැංකු නිලධාරීහු හදිසියේ ම තම යෝධ විදේශ හුවමාරු සංචිතයන්ගෙන් - ජපානයේ ඩොලර් බිලියන 850ක් හා කොරියාවේ ඩොලර් බිලියන 200ක් - ඩොලර් වත්කම් විකිනීමේ සැලැස්මක් නැතැයි නිවේදනය කල අතර එම ප්‍රතිඥාව මගින් වෙලඳපල තාවකාලිකව ස්ථාවර විය. එහෙත් මෙම සිද්ධියේ ගම්‍යයන් පැහැදිලි යඃ ඇමරිකානු අධිරාජ්‍යවාදය වර්තමානයේ දී තම මිලිටරි බලපෑම ලෝකය මත පවත්වාගනු ඇත, එහෙත් ආර්ථික දෘෂ්ටිකෝනයකින් ගත් කල එය තම ගිනුම් තුලනය කර ගැනීම සඳහා වසරකට ඩොලර් බිලියන 600 කට (පෙන්ටගනයේ සමස්ත අයවැයට වඩා වැඩි ප්‍රමානයක්) වැඩි මුදලක් නයට ගැනීමට බල කෙරී ඇති අස්ථාවර හා පිරිහෙන බලයකි.

ඇමරිකානු විදේශ පිලිවෙතේ මෙම පුපුරන සුලු හා ව්‍යාකුල තත්වය ගැඹුරක් නැති මිලිටරි බලය හා ගැඹුරු ආර්ථික දුර්වලත්වය අතර තියුනු පරස්පර විරෝධය තුලින් ගලා එයි. එම අර්ථයෙන් ගත්කල වැදගැම්මකට නැති ගැලවුම්කරුවෙක් මෙන් ගෝරනාඩු කරන බුෂ් අහම්බ චරිතයක් නො වේ. ඔහු පුද්ගලාරෝපනය කරන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය හා එය වැටී ඇති ඓතිහාසික අන්ධපථය යි.

© www.wsws.org